රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

තෙවන වාර පරීක්ෂණය - 2018

Third Term Test - 2018

15 S I.

ක්‍රිස්තියානි ධර්මය I

කාලය : පැය 01

විභාග අංකය :.......................................

10 ශ්‍රේණිය ...............

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) "බලන්න කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයෙකු බිහි කරන්නීය. ........................ යන නම ඔහුට තබන්නීය" ඉහත හිස් තැනට අදාල වදන වනුයේ.

(I) "එප්‍රාතා" යන්නයි
(II) "අර්කෙලාවුස්" යන්නයි
(III) "මෙසියස්" යන්නයි
(IV) "එම්මානුවෙල්" යන්නයි

(02) මරියතුමිය ආදර්ශයට ගන්නා කිතුනුවන්

(I) දේව හඬට කීකරුවෙමින් පූර්ණ විශ්වාසයෙන් දිවි ගෙවිය යුතුය
(II) සමාජ ගහංචි හා නින්දා වලට එරෙහිව හඬක් නැගිය යුතුය
(III) දේව බල ලකුණු අයදිමින් නොකඩවා යාච්ඤාවේ යෙදිය යුතුය
(IV) විවාහය පිළිබඳ බුද්ධිමත් තීරණ ගැනීමට යොමු විය යුතුය.

(03) සබත් දින ධර්ම ශාලාවේදී ජේසුස් වහන්සේ විසින් සුව කරනු ලැබුවෙකි.

(I) මහලේ රෝගී ස්ත්‍රිය
(II) අන්ධ බාර්තිමෙයස්
(III) කුදු ස්ත්‍රිය
(IV) ලාදුරු රෝගියා

(04) ජේසුස් වහන්සේගේ රූප විපර්යාසයේදී ... ප්‍රකාශිත සංකේතයක් ලෙස දැක්විය හැක්කේ.

(I) එලියා හා මෝසෙස් දර්ශනය වීමයි
(II) උන්වහන්සේගේ වස්ත්‍ර ධවල කාන්තියෙන් බැබලීමයි
(III) අහසින් හඬක් නික්මීමයි
(IV) ශ්‍රාවකයන් යාච්ඤාවට යොමු වීමයි

(05) දින 40 ක් වියැති බිළිඳු ජේසුස් වහන්සේ වෙනුවෙන් ඉටුකරන ලද චාරිත්‍රය වූයේ.

(I) කැප කිරීමයි
(II) නම් තැබීමයි
(III) චර්මච්ඡේදනයයි
(IV) පාස්කු පිළිවෙතයි

(06) නාසරෙත් ධර්ම ශාලාවේදී ජේසුස් වහන්සේ තහවුරු කළ සත්‍යතාවයකි.

(I) යුදෙව් ආගමික සමාජය සුණු විසුණු වන බව
(II) දේව රාජ්‍යය අන්‍යයන් සඳහා ද විවෘතව පවතින බව
(III) පූජාවන් ඔප්පු කිරීමෙන් මුළු මිනිස් සංහතියට මිදීම අත්වන බව
(IV) යුදෙව් නීති පද්ධතිය සංශෝධනය කිරීමෙන් දේව රාජ්‍යයට යන මග සළසා ගතයුතු බව

(07) කිතුනු ජීවිතයේ 'අත්තිවාරම' ලෙස හඳුන්වා දිය හැක්කේ.

(I) දිව්‍ය පූජාව ය (II) යාච්ඤාව ය

(III) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් ය (IV) සැප සම්පත් ය

(08) ''මුළු ඉශ්‍රායෙල් ජනතාව අතරවත් මෙතරම් ශ්‍රද්ධාවක් මා දුටු නැත'' යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ.

(I) ශතාධිපතියාගේ දාසයා සුවපත් කිරීමේ සිදුවීමේදී ය

(II) නායින් නුවර වැන්දඹුවගේ පුතා මරණින් නැගිටුවීමේ සිදුවීමේදී ය

(III) ජෙරිකෝවේ අන්ධ මිනිසා සුවපත් කිරීමේ සිදුවීමේදී ය

(IV) ගොළු බිහිරෙකු සුවපත් කිරීමේ සිදුවීමේදී ය

(09) මිනිසුන් විසින් ජේසුස් වහන්සේ හඳුනා ගනු ලබන්නේ.

(I) 'මෙහෙසුරු දිවැසිවර' ලෙස ය

(II) 'පරිශුද්ධයාණන්' ලෙස ය

(III) 'දාවිත්ගේ වංශයෙන් පැමිණි මිදුම්කරු' ලෙස ය

(IV) 'විජාතීන්ට එළිය දෙන ආලෝකය' ලෙස ය

(10) ජේසුස් වහන්සේ විසින් කාන්තාවන්ට දොරගුළු විවර කරන ලද්දේ.

(I) සමාජ සම්මතයන්ට පිටුපා යෑම සඳහාය

(II) දේව රාජ්‍යයේ මෙහෙවර ඉදිරියට ගෙන යෑම සඳහාය

(III) කඩිනමින් ජීවිත අභියෝග ජය ගැනීම සඳහාය

(IV) දේව රාජ්‍යයේ විශිෂ්ඨතම ස්ථානය හිමි කර ගැනීම සඳහාය

(11) දේව අභිමුඛත්වය හා පාපයෙන් පිරිසිදු කිරීම සඳහා සංකේතය වූයේ.

(I) ගින්න ය (II) සුළඟ ය (III) ජලය ය (IV) පරවියා ය

(12) කුරුසිපත්ව සිටිමින් පසුතැවිලි වූ වරදකරුවා මඟින් අප ඉගෙන ගන්නා පාඩම නම්,

(I) අසාධාරණ විනිශ්චයයන් හමුවේ නැගී සිටිය යුතු බවය

(II) විශ්වාසය තුල දේව රාජ්‍යයත්වය අත්දැකිය හැකි බවය

(III) පරීක්ෂා ජයගත හැකි වන්නේ දේව වචනය මඟින් පමණක් වන බවය

(IV) ජීවිතයේ තීරණාත්මක අවස්ථාවන් බොහෝමයක් එළඹෙන බවය

(13) ''මා පියාණන්ගේ මැදුරෙහි මා සිටිය යුතු බව'' යන්නෙන් අවධාරණය කෙරෙනුයේ.

(I) ආගමික වත් පිළිවෙත්හි යෙදීමේ අවශ්‍යතාවයයි

(II) දේව මාළිගය ගොඩ නැගීමේ වැදගත් කමයි

(III) ආගමික සංස්ථා පවිත්‍රව පවත්වා ගැනීමේ අවශ්‍යතාවයයි

(IV) දේව මෙහෙවරෙහි යෙදීමේ වැදගත්කමයි

(14) පැරණි ගිවිසුම් සිදුවීම් කිහිපයක් පහත දැක්වේ

A. ආදම් හා ඒව පිළිබඳ සිදුවීම

B. ශරෙපත් හි වැන්දඹුව

C. දානියෙල් සිංහ ගුහාවෙහි සිටීමේ සිදුවීම

D. සිරියානු ජාතික නාමන් පිළිබඳ සිදුවීම

ඒ අතුරින් ජේසුස් වහන්සේ නාසරෙත් ධර්ම ශාලාවේදී ගෙනහැර පෑ පැරණි ගිවිසුම් සිදුවීම් නම්.

(I) A හා B ය (II) B හා D ය (III) C හා A ය (IV) D හා C ය

(15) ජේසුස් වහන්සේ විසින් හෙළා දුටු පරිසි දුර්වලතාවක් වූයේ.

(I) ප්‍රාතිහාර්යය දක්වමින් ජනතාව මුලා කිරීමයි

(II) පුනරුප්පත්ති විශ්වාස නොකිරීමයි

(III) සිය බලය රැක ගැනීම සඳහා රෝම රජයට පක්ෂපාතී වීමයි

(IV) ප්‍රේමයෙන් තොර ආගමික පිළිවෙත් වලටගැති වීමයි

(16) "ඇඳුම දෙකක් ඇති අය නැති අයට දෙන්වා" යන්නෙන් ස්නාවක ජොහාන් ඉස්මතු කළේ.

(I) පසුතැවීම හා සාධාරණත්වයයි

(II) යුක්තිගරුක භාවය හා අවංක භාවයයි

(III) බෙදා ගැනීම හා සාධාරණත්වයයි

(IV) පසුතැවීම හා යුක්තිගරුක භාවයයි

(17) නැතිවූ පුත්‍රයාගේ උපමාව අප යොමු කරවන්නේ.

(I) පාප මාර්ගයෙන් හැරී දෙවිඳුන්ගේ අසීමිත ප්‍රේමය වෙත ළඟාවීමට ය

(II) දේව රාජ්‍යයේ කැඳවීම වෙත අන් අය ගෙන ඒමට ය

(III) මිනිස් නිදහසේ අසීමිත බව වටහා ගැනීමට ය

(IV) නිවැරදි ජීවිත තීරණ ගනිමින් බුද්ධිමත්ව ක්‍රියා කිරීම ය

(18) ජේසුස් වහන්සේ ඔලිව කන්දේ සිට කළ යැදුම.

(I) සතුරු අන්තරාය වලින් මිදී දේවාරක්ෂාව පැතීමට අප යොමු කරවයි

(II) දේව කැමැත්ත ඉටු කිරීමට ප්‍රමුඛත්වය දීමට අපට මග පෙන්වයි

(III) දුක් විඳීමෙන් තොර දිවියකට අවතීර්ණ වීමට අප කැඳවයි

(IV) දේවානුග්‍රහය තුළ ක්ෂණික තීරණ ගැනීමට අප පොළඹවාලයි

(19) ආබ්‍රහම්ගේ පුත්‍රයෙකු ලෙස ජේසුස් වහන්සේ විසින් හඳුන්වා දෙනු ලැබුවේ.

(I) ජුදාස් ය (II) පේදුරු ය (III) සාකෙවුස් ය (IV) බාර්තිමෙයස් ය

(20) ජෙරුසලමේ ස්ත්‍රීන්ට ජේසුස් වහන්සේ පැවසුයේ.

(I) උන්වහන්සේ වෙනුවෙන් හඬන ලෙසට ය

(II) ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් දුක් නොවන ලෙසට ය

(III) ඔවුන්ගේ ඥාතීන් වෙනුවෙන් දුක් නොවන ලෙසට ය

(IV) ඔවුන් හා දරුවන් උදෙසාම දුක් වන ලෙසට ය

(21) ජේසු උපත පිළිබඳව සුභාරංචිය ලද එඬේරුන් මෙන් අප.

(I) පැහැදිලි සමාජ චින්තනයකින් යුතුව ක්‍රියා කල යුතුය

(II) යුහුසුළුව දේවස්ථානයේ කටයුතු වලට යන හිත දිය යුතුය

(III) සියලු බාධක මඟ හරිමින් දේව හඬට සැපත් ප්‍රතිචාර දැක්විය යුතුය

(IV) දේව වචනය ව්‍යාප්ත කිරීමට නොපසුබටව ක්‍රියා කල යුතුය

(22) ගබ්‍රියෙල් දේවදූතයා සෙකරියස්ට පැවසූ ලෙස ස්නාවක ජොහාන්ට හිමිවන්නේ.

(I) එලියාගේ ආත්මානුභාවයයි

(II) මලාකිගේ ආත්මානුභාවයයි

(III) මෝසෙස්ගේ ආත්මානුභාවයයි

(IV) සෙකරියාගේ ආත්මානුභාවයයි

(23) ස්වර්ගයේ නාම ලියවී ඇති නිසා ප්‍රීති විය යුතු බව ජේසුස් වහන්සේ පැවසුයේ,

(I) සද්දුසිවරුන්ට ය
(II) දරුවන්ට ය
(III) ශ්‍රාවක ධර්මදූතයන්ට ය
(IV) නිකදේමුස්ට ය

(24) "ඔබගේ හිසකෙස් සියල්ල පවා ගණන් කොට ඇත" යනුවෙන් පවසමින් ජේසුස් වහන්සේ විසින් ...වීමත් කරනු ලැබුයේ,

(I) නව වෘත්තීන් සොයා යන්නන්ය
(II) අදමිටුකම්වලට මුහුණ පාන්නන්ය
(III) පෞද්ගලික අවශ්‍යතා පිළිබඳව කරදර වන්නන්ය
(IV) සැම විටම කැපී පෙනීමට උත්සහ දරන්නන්ය

(25) සුළු දෙයක් පිළිබඳව විශ්වාසවන්ත විය යුතු බව හඟවන උපමාව නම්,

(I) මුහුන්ය
(II) රන්කාසි දසයය
(III) වපුරන්නාය
(IV) නැතිවූ කාසියය

(26) කිතුනු බව්තීස්මය අර්ථවත් කර ගැනීමට නම් අප,

(I) ක්‍රියාකාරී කිතුනුවෙකු විය යුතුය
(II) බලයෙන් පූර්ණ විය යුතුය
(III) ප්‍රායෝගික දිවියකට පුරුදුවිය යුතුය
(IV) මනස්ථාපනයේ නව දිවියක් වෙත යොමු විය යුතුය

(27) ජේසුස් වහන්සේ හා ලේ නෑකම් ඉක්මවා යන සබඳතාවයකට පත් වන්නේ,

(I) දේවසේවයේ යෙදෙන්නන්ය
(II) ආගන්තුක සත්කාරයට යොමු වුවන්ය
(III) දේව වචනය පිළිපදින්නන්ය
(IV) දිළිඳුන් සලකන්නන්ය

(28) දේව මාළිගාවේ සිටි දිළිඳු වැන්දඹුව විසින් ඉදිරිපත් කරනලද්දේ,

(I) නිතරම ස්තුතිවන්ත වීමේ අවශ්‍යතාවයයි
(II) පරිත්‍යාගශීලීත්වයේ අගයයි
(III) යටහත් පහත් වීමේ වැදගත් කමයි
(IV) කමාව යැදීමේ වටිනාකමයි

(29) සතුරන් කෙරෙහි ප්‍රේමය දැක්වීම සඳහා අපට මග පෙන්වන්නේ,

(I) රන් අණය
(II) අබ ඇටය පිළිබඳ උපමාව ය
(III) අත්තිවාරම් දෙක පිළිබඳව ඉගැන්වීමය
(IV) අත්තික්කා ගසය

(30) "මා අනුව එන්න" යැයි ජේසුස් වහන්සේ පැවසූ විට ඔහුගේ ප්‍රතිචාරය වූයේ,

(I) ක්ෂණිකවම උන්වහන්සේ අනුගාමී වීමය
(II) සිය පියා භූමදාන කර එනු පිණිස අවසර පැතීමය
(III) නොහැකි බව ඍජුවම පැවසීමය
(IV) ගෙදර අයගෙන් සමුගෙන ඒමට පිටත්ව යෑමය

(31) ජේසුස් වහන්සේගේ සොහොන වෙත ළඟාවූ කාන්තාවන්ට අසන්නට ලැබුණු දේව දූත පණිවිඩය වූයේ.

(I) "ඒකාන්තයෙන් සමිඳානන් වහන්සේ නැගිට සිටින සේක" යනුයි

(II) "ඔබ කැළඹී සිටින්නේ මන්ද?" යන්නයි

(III) "ජෙරුසලමට වහාම පිටත්ව යන්න" යන්නයි

(IV) "ජීවමාන තැනැත්වහන්සේ මළවුන් අතර සොයන්නේ මන්ද" යන්නයි

(32) ධනවතා හා ලාසරුස්ගේ උපමාවෙන් පන්නාරය ලබන කිතුනුවා.

(I) තම සම්පත් අන් අයගෙන් ආරක්ෂා කරගත යුතුය

(II) දිළිඳු අය අධ්‍යාත්මිකව ගොඩ නැගීමට වෙහෙස දැරිය යුතුය

(III) දිළිඳුන්ට හැකිනාක් ප්‍රේමයෙන් උපකාර කිරීමට යොමුවිය යුතුය

(IV) සිය සම්පත් වලින් කොටසක් දිළිඳුන් පුනුරුත්ථාපනය කිරීමට වැයකල යුතුය

(33) දෙවියන් වහන්සේගේ තෝරාගත් ජනතාව අතුරින් අධිපතියෙකු පහල වන බව ප්‍රකාශ කරන ලද්දේ.

(I) මීකා දිවැසිවරයාය

(II) යෙසායා දිවැසිවරයාය

(III) එසකියෙල් දිවැසිවරයාය

(IV) ජෙරමියා දිවැසිවරයාය

(34) පිලිප් විසින් ඉතියෝපීය නපුංසකයාට පහදා දුන් ශුද්ධ ලියවිලි පාඨය මගින් ඉස්මතු වූයේ.

(I) ජේසුස් වහන්සේගේ නායකත්වයයි

(II) ජේසුස් වහන්සේගේ සදාගත ජීවනයයි

(III) ජේසුස් වහන්සේගේ ඒකත්වයයි

(IV) ජේසුස් වහන්සේගේ සේවකත්වයයි

(35) දේව රාජ්‍යයේ පුරවැසියන් නිරතුරුවම.

(I) සිය සේවය පිළිබඳව සැහීමකට පත්විය යුතුය

(II) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් මෙනෙහිකල යුතුය

(III) සිය වගකීම ස්තුතියක් නොපතා කැපවීමෙන් ඉටුකල යුතුය

(IV) අන් අයගේ ආකල්ප වෙනසකට මග පෑදිය යුතුය

(36) කිතුනු අප උත්සව සඳහා ආරාධනා කිරීමේදී ප්‍රමුඛත්වය ලබාදිය යුතු වන්නේ.

(I) අප මෙන් කිතුනු අදහස් හා ආකල්ප දරන්නන්ටය

(II) නැවත අපට ආරාධනාවක් දිය නොහැකි දිළිඳු අයටය

(III) අපට හිතවත් නෑදෑ හිත මිතුරන් හා අසල්වාසීන්ටය

(IV) කලකින් අපට හමු නොවූ සියලු දෙනාටය

(37) "මෙය ඔහුගේම කටින් කියනවා අපගේම කනින් ඇසීමු" මෙහි "මෙය" ලෙස අර්ථ දක්වා ඇත්තේ.

(I) ජේසුස්වහන්සේ වරදක් කර ඇති බවය

(II) ජේසුස්වහන්සේ දේව මාළිගාව කඩා දමන බවය

(III) ජේසුස්වහන්සේ ප්‍රජාදේව වරදන්ගේරට බවය

(IV) ජේසුස්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් බවය

A - සබත දිනයේ අධ්‍යාත්මික පවිත්‍රතාව එක ගැනීම අවධාරණය කර ගැනීම

B - සබත් දිනයේදී පුද්ගල ව්‍යවස්ථාව අකුරටම පිළිපැදීම

C - සබත් දිනයේදී මානුෂිකත්වයට ප්‍රමුඛතාවයක් ලබා දීම

D - සබත් දිනයේදී සමාජ ජීවිතයෙන් බැහැර වීම

මේ අතුරින් ජේසුස් වහන්සේගේ වැදගත් මඟ පෙන්වීම් නම්,

(I) A හා C ය (II) B හා D ය (III) C හා B ය (IV) D හා A ය

(39) උත්තම පූජකයාගේ දාසයාගේ කන සුවපත් කිරීමේ සිදුවීම මඟින් ජේසුස් වහන්සේ පෙන්වා දෙනු ලැබුයේ,

(I) උත්තම පූජකයාට ද්‍රෝහි වීම නොකටයුත්තක් බවයි

(II) තම ශ්‍රාවකයා අතින් සිදුවූ වරදෙහි වගකීම තමා භාරගන්නා බවයි

(III) ප්‍රාතිහාර්ය සිදු කල යුතු අවස්ථාවන්හි ඒ සඳහා පසුබට නොවිය යුතු බවයි

(IV) ජීවිත අභියෝග හමුවේදී වුවද සතුරාට ප්‍රේමකල යුතු බවයි

(40) දේව රාජ්‍යයේ වටිනාකම් බෙදා ගැනීම සඳහා කිතුනු අප,

(I) ගැඹුරු මානව සම්බන්ධතා පවත්වා ගැනීමට යොමුවිය යුතු වේ

(II) දේව රාජ්‍යයේ වටිනාකම් මනාව අර්ථකතනය කල යුතු වේ

(III) සමාජයෙන් පිටු දක ඇති සියලු අසරණ දනට පිහිට විය යුතු වේ

(IV) හැකි සෑම අවස්ථාවකදීම ඒ සඳහා සැලසුම් හා වැඩ සටහන් සකස් කල යුතු වේ

(ලකුණු 1 X 40 =40)

රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

තෙවන වාර පරීක්ෂණය - 2018

Third Term Test - 2018

| 15 | S | II |
|---|---|---|

ක්‍රිස්තියානි ධර්මය II    කාලය : පැය 02

විභාග අංකය :.....................................    10 ශ්‍රේණිය ........... ....

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

i "සාගිනි වුවන් යහපත් ඇදයින් සතප්වා ධනවතුන් හිස් අතින් ඇරිය සේක" මෙය සඳහන් වන්නේ කවරෙකු විසින් ගයන ලද ගීතයකද?

ii ............................ ඇවිද්ද සෙනග මහත් ආලෝකයක් දුටුවෝය. ...................... දේශයේ විසූ අය කෙරෙහි එළියක් ආන් බබලන්නේය. මෙහි හිස්තැන් පුරවන්න.

iii ජේසුස්වහන්සේගේ උපත දිළිඳුන්ට විශේෂිත වූ බව දැක්වීමට කරුණු දෙකක් ලියන්න.

iv පහත සඳහන් සත්‍යයන් හැබව ඇති ජේසුස්වහන්සේ ඉදිරිපත් කළ උපමා මොනවාද?

   a. දෙවරාජ්‍යයේ පුරවැසිභාවය හිමිකර ගැනීමට නිහතමානිබව වැදගත් වේ.

   b. දෙවරාජ්‍යයේ වර්ධනයට කුමන බාධා පැමිණියද එය ක්‍රමානුකූලව වර්ධනය වේ.

v සබත් දිනයේදී ජේසුස්වහන්සේ විසින් සුව කළ රෝගීන් දෙදෙනෙකු නම් කරන්න.

vi ජේසුස්වහන්සේගේ ශ්‍රාවකයන් ගිය ධර්මදූත චාරිකා වලින් ලද ප්‍රතිඵල දෙකක් ලියන්න.

vii "ස්වාමිනි, මා ඔබගේ උපකරණයක් කරගත මැනව. වෛරයෙන් පිරුණු තැනට ප්‍රේමය ද, අසමගියෙන් පිරුණු තැනට......." මෙසේ සඳහන් වන්නේ කුමන යැදුමකද?

viii ජේසුස්වහන්සේගේ දේවත්වය හෙළිදරව් කළ අවස්ථා දෙකක් ලියන්න.

ix පහත A හා B සම්පූර්ණ කරන්න.

දේව රාජ්‍යය තුළ

   A. පුරවැසිභාවය :

   B. ව්‍යවස්ථාව / නීති මාලාව :

x ජේසුස්වහන්සේ යාච්ඤා කළ අවස්ථා දෙකක් ලියන්න.

යාච්ඤාව කිතුනුවාට වැදගත් වන්නේ ඇයි?

(ලකුණු 2 x 10 =20)

"ස්නාවක ජොහාන් තුමාගේ පෙරමග දූතත්වය අද්විතීය වේ."

1) ස්නාවක ජොහාන් තුමාගේ ප්‍රධාන මෙහෙය වූයේ කුමක්ද?

(II) පහත සඳහන් ජන කොටස් සඳහා ස්නාවක ජොහාන් තුමා දුන් අවවාද ලියා දක්වන්න.

(අ) අයකැමියන්

(ආ) සාමාන්‍ය ජනතාව

(ඉ) භේවායන් (ලකුණු 3 යි)

(III) ස්නාවක ජොහාන් තුමාගේ මෙහෙය හා පණිවුඩය වත්මන් කිතුනුවන්ටද ආදර්ශයක් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 5 යි)

(03) "අභියෝග ජයගැනීම දේවරාජ්‍යයේ පුරවැසියන්ගේ පූතුකම වේ"

(I) දේව රාජ්‍යයේ පුරවැසියන්ට ඇති අභියෝග දෙකක් ලියන්න. (ලකුණු 2 යි)

(II) ජේසුස් වහන්සේ විසින් වදාල පහත සඳහන් ආශයන්හි අදහස් පැහැදිලි කරන්න.

(අ) "කුරුසිය දරාගෙන මා අනුගාමී වන්න"

(ආ) "නොදිරන පසුම්බි ද නොපිරිහෙන වස්තු ද ස්වර්ගයෙහි ඔබට සපයා ගන්න"

(ඉ) නගුලට අත තබා ආපසු බලන කිසිවෙක් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට නුසුදුසුය" (ලකුණු 3 යි)

(III) දේවරාජ්‍යයේ පුරවැසිභාවය පතන සැමදෙනා වෙනුවෙන් මඟ පෙන්වීම් මාලාවක් පිළියෙල කරන්න. අවම වශයෙන් මඟ පෙන්වීම් පහක්වත් ඇතුලත් විය යුතුය. (ලකුණු 5 යි)

(04) ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය හා කුරුසිපත්වීම කිතුනුවන්ට මහත් පාඩම් රැසක් පෙන්න දෙයි.

(I) ජේසුස් වහන්සේ විනිශ්චය සඳහා ඉදිරිපත් කල පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 2 යි)

(II) පහත සඳහන් අය ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියේදී දක්වූ ප්‍රතිචාරය ලියා දක්වන්න.

(අ) සිරේනියේ සීමොන්

(ආ) මුර සෙබලුන්

(ඉ) අරිමාතියේ ජෝසෙප් (ලකුණු 3 යි)

(III) ඉහත පුද්ගලයන්ගේ ප්‍රතිචාර මගින් අප කිතුනු ජීවිත වලට ලබාගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 5 යි)

(05) ජේසුස් වහන්සේ විවිධ ආගමික ප්‍රශ්න නිරාකරණය කිරීමට උත්සාහ ගත් සේක.

(I) පහත සඳහන් නිදසුන් ජේසුස් වහන්සේ ගෙනහැර පාවේ කුමන ප්‍රශ්ණයේදී ද?.

(අ) දාවිත් රජු සහ පිරිවර

(ආ) මනාලයා හා මඟුල් ගෙදර (ලකුණු 2 යි)

(II) එම අවස්ථා වලදී ජේසුස් වහන්සේ ඉදිරිපත් කල සත්‍යතා තුනක් ලියන්න. (ලකුණු 3 යි)

(III) වත්මන් කිතුනුවන්ට සිය ආධ්‍යාත්මික දිවිය හැඩ ගස්වා ගැනීමට එමඟින් ලැබෙන මඟ පෙන්වීම පහදන්න. (ලකුණු 5 යි)

(06) සැම කිතුනුවෙකුටම පරීක්ෂාවලට මුහුණ දීමට සිදුවේ.

(I) ජේසුස්වහන්සේ මුහුණ දුන් දෙවන හා තුන්වන පරීක්ෂා ශු. ලූක් සුභාරංචිය ඇසුරෙන් ලියා දක්වන්න. (ලකුණු 2 යි)

(II) එම පරීක්ෂා අවස්ථා වලදී ජේසුස්වහන්සේ අපට ඉගැන්වූ වැදගත් පාඩම් තුනක් ලියන්න. (ලකුණු 3 යි)

(III) පරීක්ෂා ජය ගැනීම සඳහා ජේසුස් වහන්සේගෙන කිතුනුවාට ලැබෙන ආදර්ශය විස්තර කරන්න. (ලකුණු 5 යි)

(07) පහත සඳහන් මාතෘකා අතුරෙන් 2 ක් තෝරා කෙටි සටහන් ලියන්න.

(I) එඬේරුන්ට දේවදූත පණිවුඩය

(II) පව්කරුවන් හා ජේසුස්වහන්සේ

(III) ශ්‍රද්ධාව පිළිබඳ ඉගැන්වීම්

(IV) මුල් ශ්‍රාවකයින් කැඳවීම (ලකුණු 5X2 -10 යි)